**සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ 7.4(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායාමක් ලෙස සැළකිය යුතු රු.561,602 ක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 7.5(අ) ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස සැළකිය යුතු රු.24,000 ක යන්ත්‍ර මිලදී ගැනීම් සඳහා කරන ලද ගෙවීම් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 7.8(ඇ) ඡේදය ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද පොලී ආදායම බදු පෙර ලාභයෙන් අඩුකර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, එම වටිනාකම බදු පෙර ලාභයට එකතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි නිවැරදිව දැක්වීමට කටයුතු කරමි. | -එම- |
| (ඈ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 7.4(අ) ඡේදය ප්‍රකාරව තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුහුණත වෙනම ඉදිරිපත් කළයුතු වුවත්, රු.1,100,784 ක් වූ තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වෙනම දක්වා නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඉ) | කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයේ අංක 17.19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාගම සතු පිරිවැය රු.7,800,562 ක් වූ වාහන 19 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමාගම සතුව පවතින වාහන ප්‍රත්‍යාගණනය කිරීමට 2022 වර්ෂයේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී ආරම්භක තොග ශේෂය තුළ රු.9,186,655 ක ප්‍රාග්ධන ජෛව තොගයක් ද, අවසන් තොග ශේෂය තුළ රු.8,423,475 ක ප්‍රාග්ධන ජෛව තොගයක්ද ඇතුළත් කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.763,180 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම යටතේ දැක්විය යුතු වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු අගයන්හි වෙනස්වීම මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වූවත්, රු.1,843,245 ක් මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් දැනට පාවිච්චි කරමින් පවතින ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙහි සත්ව කෑම ගබඩාවක්, මෝටර් කාමරයක් (Pump House), එළු ගබඩා දෙකක්, ටොයෝටා ඩබල්කැබ් රථයක්, දම්මින්න ගොවිපොළෙහි මහේන්ද්‍රා ට්‍රැක්ටරයක්, ට්‍රැක්ටර් ටේලරයක් හා වගා ළිං දෙකක පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | මෙම ගොඩනැගිලි 2018 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබූ අතර, 2016 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයේදී හඳුනාගෙන වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇත. මෙම වත්කම් තක්සේරු කර 2022 වර්ෂයේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඈ) | විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව සමාගම සතුව පැවතුණු නිරාවිය, තුංකම කන්තලේ, සිද්ධපුර හා මුතුවැල්ල යන ගොවිපළවල් 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණද, එම ගොවිපොළවල් සතු පිරිවැය රු.25,073,083 ක් වූ ගොඩනැගිලි හා සවිකිරීම් 164 ක්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ 63 ක්, ජෙනරේටර් 03 ක් හා ලීබඩු හා සවිකිරීම් 260 ක් තවදුරටත් සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. එම වත්කම්වලට අදාල වාර්ෂික ක්ෂය රු.1,873,629 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ඒවායේ භෞතික පැවැත්ම පිළිබඳ සත්‍යාපනයක් මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් සිදුකර නොතිබීම හේතුවෙන් එම වත්කම්වල භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු නොවුණි. | මෙම වත්කම් 2005/2008 සහ 2010 යන වර්ෂවලදී සමාගමේ පරිපාලනයෙන් ඉවත්වූ ගොවිපලවල් වේ. මෙම ගොවිපලවල් නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරා ගැනීමේදී ඒ පිළිබඳව ලිඛිත දැනුම්දීම් සිදුකර නොමැති බැවින්, වත්කම් මාරු කිරීමේ හැකියාවක් නොවූ අතර, මේ පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දැනුවත් කර ඇත. මේ වනවිට ඒ පිළිබඳව මහවැලි අධිකාරිය විසින් කටයුතු කරගෙන යනු ලබන අතර, 2022 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ණයගැති ශේෂ යටතේ රු.617,513 අවිනිශ්චිත ගිණුම් ශේෂයක් දක්වා තිබුණි. | 617,513 | වර්ෂ 04 | මෙම ශේෂය 2022 වර්ෂයේදී නිවැරදි කරමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළයුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 285,185 | ශේෂ තහවුරු කිරීම් හා බදු සහතික පත්‍ර | මෙම ශේෂයන් 2021 වර්ෂයේ සිට පැවත එන අගයක් වේ. මේ සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයේදී කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ශේෂ සනාථන විගණනයට ඍජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු අතර, නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය |
| (ආ) | ගෙවිය යුතු එකතුකළ අගය මත බදු | 2,991,095 | | | |
| (ඇ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවට ගෙවිය යුතු අත්තිකාරම් | 165,600 | ශේෂ තහවුරු කිරීම් | ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කරමි. | ශේෂ සනාථන විගණනයට ඍජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු අතර ,නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය |
| (ඇ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු අත්තිකාරම් | 170,092 | | | |
| (ඉ) | දම්මින්න අන්තර් ගොවිපල ශේෂ | 1,908,021 | ශේෂ තහවුරු කිරීම් | දම්මින්න ගොවිපලේ රු.1,908,021 ක ශේෂය මාස් කන්නය වෙනුවෙන් දරන ලද වියදම් 2022 වර්ෂයට ගැලපීම සඳහා රඳවාගෙන ඇති ශේෂයන් වේ. මෙය 2022 වර්ෂයේදී නිවැරදි කරමි. | -එම- |

(ඊ) පොදු සංචිතය

| | | | | |
|---|---|---|---|---|
| • මහවැලි ආර්ථික ඒජන්සිය | 403,918,731 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට ඉදිරියට එන ශේෂයන් වේ. මේ පිළිබඳව දැනුම් දුන් ලිපියක් සමාගම සතුව නොමැත. සමාගමක් බවට පත්කරන අවස්ථාවේදී මෙම ශේෂයන්ට කොටස් නිකුත් කර නොමැත. 2022 වර්ෂයේදී මේ පිළිබඳව මහවැලි අධිකාරිය නැවත වරක් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු අතර, නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය |
| • කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | | | |
| • යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කිරීමට අදාල ලියකියවිලි | | |
| • විදේශ ආධාර | 5,729,782 | | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අමාත්‍යාංශය-නිරාවිය ගොවිපල යනුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.5,820,430 ක ණයගැති ශේෂය වර්ෂ 10 කටත් වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. 2010 වර්ෂයේදී සමාගම සතුව පැවති සතුන් තොගයක් මහවැලි අධිකාරිය වෙත ලබාදී තිබූ බවත්, අධිකාරිය විසින් එම සතුන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබාදී තිබූ බවත් විගණනයට අනාවරණය වූ අතර, මෙම ණය අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළද කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිගින් දිගටම මහවැලි අධිකාරිය වෙත ලිපි මගින් දැනුවත් කර ඇත. ඉදිරි වර්ෂයේදී මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "එච්" කලාපයේ මූල්‍ය ප්‍රකාශන අනුව මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ ණයහිමි ශේෂය රු.5,373,970 ක් වුවද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති ශේෂය රු.5,820,430 ක් විය. ඒ අනුව රු.446,460 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම රු.446,460 ක ශේෂය සමාගම, මොරගහකන්ද කළුගඟ ව්‍යාපාරයට පවරා ගන්නා අවස්ථාවේදී සමාගම සතුව තිබූ නිෂ්පාදන අමුද්‍රව්‍ය තොගයෙහි වටිනාකම් වේ. | ශේෂ නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සේවකයන්ට ගෙවිය යුතු රු.6,893,711 ක හිඟ වැටුපෙන් රු.1,435,542 ක් ද එම හිඟ වැටුප් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුව තිබුණු මුදලින් රු.312,054 ක් ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතුව තිබුණ මුදලින් රු.46,808 ක් ද, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී කපාහැර තිබුණි. | ඉදිරි වර්ෂයේදී ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට හා ගෙවිය යුතු මුදල ගෙවීමට නොපමාව කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩීඑෆ්සීසී බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.89,412 ක ඉතිරි කිරීමේ ගිණුම වර්ෂ 07 ක කාලයක් තිස්සේ අක්‍රියව පැවතුණි. | මෙම ගිණුම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අක්‍රීය බැංකු ගිණුම් සම්බන්ධව කටයුතු කළයුතුය. |
| (ආ) | ප්‍රමාණවත් මුදලක් අතරදවාගෙන ඉතිරි මුදල් බැංකුගත කිරීම වෙනුවට රු.869,285 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේ අතරදවාගෙන තිබුණි. | ඉදිරියේදී බැංකු ගතකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළයුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,325,556 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.5,793,006 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,467,450 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාගමේ මෙහෙයුම් ආදායම වර්ධනයවීමත්, සේවක වැටුප් හා දීමනා අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතවී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2021 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි. නිකුත් කර තිබූ කොටස් 03 ම වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු අතර, මහවැලි අධිකාරියේ හිමිකාරීත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි. | මේ පිළිබඳව මහවැලි අධිකාරිය වෙත නැවත වරක් දැනුම්දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත කොටස් නිකුත් කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව විගණනය වෙත ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. මෙම ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරීත්වය පිළිබඳව අධ්‍යක්ෂවරුන් සොයා බලා ඇති බවට කාරුණිකව දන්වා සිටිමි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පළතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර, මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සුළු වශයෙන් සිදුකරමින් පැවතුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ගිවිසුම ක්‍රියාත්මක වූ පසු මෙම සාංගමික සංස්ථා පත්‍රයට අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ප්‍රත්‍යාගණන අගය රු.2,898,812 ක් වූ වාහන 03 ක් ද, ප්‍රත්‍යාගණනය නොකළ වාහනයක් ද, රු.14,929,159 ක් වූ සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම ද සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණද, එම වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී ද මහවැලි අධිකාරිය වෙත දැනුවත් කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සටහන් කර ගනිමි. | වත්කම් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී හානිවූ, අළුත්වැඩියා කළයුතු, වෙන්දේසි කළයුතු, කැඩුණු සහ සුන්බුන් ලෙස හඳුනාගත් රු.9,453,140 ක් වටිනා භාවිතයට ගත නොහැකි ස්ථාවර වත්කම් අයිතම 312 ක් 2022 මාර්තු වනවිටද අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අපහරණය කිරීමට කටයුතු කරමි. | වත්කම් අපහරණය කිරීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | ගිරාදුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටි කිරි සැකසුම්හල ආරම්භ කරන ලද 1986 වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මඟින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරන අතර වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලා තුළට කාන්දු වීම, කානු පද්ධතිය අබලන්වීම හා අභ්‍යන්තර පිරිසිදු කිරීමේ පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටළු පැන නැඟී තිබුණි. | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ වූ පසු අලුතින් කර්මාන්තශාලාවක් සඳහා ඇස්තමේන්තු ගිවිසුම තුළ ඇත. එහෙත් මේ වනවිට තාවකාලිකව අලුත්වැඩියා කටයුතු සිදුකරමින් නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යනු ලබයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අවශ්‍යතාවයන්ට අනුව කර්මාන්තශාලාව තුළ ඇතුළත බිම අලුත්වැඩියා කර ඇත. | නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත ගැටළු ඇතිවීමට තුඩුදෙන හේතූන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට පශු සම්පත් අංශයේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් යටතේ ඉලක්කගත නිෂ්පාදනය තත්‍ය නිෂ්පාදනය සමඟ සංසන්දනය කිරීමේදී බොයිලර් කුකුල් මස් නිෂ්පාදනය සියයට 14 ක් ද, ඌරු මස් නිෂ්පාදනය සියයට 24 ක්ද, එළුවන් ඇති කිරීම සියයට 21 ක් ද, මී හරක් ඇති කිරීම සියයට 47 ක් ද, වශයෙන් අඩු අගයක් ගෙන තිබුණි. | පශු සම්පත් අංශය වැඩිදියුණු කිරීමට ප්‍රාග්ධන හැකියාවක් නොමැති බැවින්, රාජ්‍ය පෞද්ගලික ගිවිසුම් ක්‍රියාත්මකවීමෙන් පසු වැඩි දියුණු කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඉලක්කගත නිෂ්පාදනය ලඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඊ) | 2020/21 මහ කන්නයේ බඩඉරිඟු වගාව සඳහා සමාගමේ ඉඩම් කන්න බදු ක්‍රමය යටතේ ගොවීන්ට බදුදීමෙන් ලබාගන්නා බදු මුදල් ආදායම මස් ගබඩා කිරීම සඳහා ශීතාගාර කන්ටේනරයක් මිලදී ගැනීමටත්, බ්‍රොයිලර් කොටු අළුත්වැඩියා කරගැනීමටත්, යෙදවීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදී තිබුණද, උපයන ලද රු.1,093,550 ක මුදල 2022 මාර්තු වනවිටත් සමාගමේ ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම බ්‍රොයිලර් ඒකකය මෙම අවස්ථාව වනවිට ලාභදායී ව්‍යාපෘතියක් නොවන බැවින්, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම පමාවී ඇත. ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | උපයන ලද ආදායම් විධිමත් අනුමැතිය ලද අරමුණු වෙනුවෙන් ඵලදායී ලෙස යෙදවිය යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී රු. 12,501,900 ක් වැයකර ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු. 8,967,600 කට අගය කර 2016 පෙබරවාරි 08 දින මෙම සමාගමට පවරාදී තිබුණි. මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය ගොවිපලට අවශ්‍ය පරිදි සකසා ගැනීම සඳහා ප්‍රාග්ධන හැකියාවක් සමාගමට නොමැත. තවද, සමාගමේ අවශ්‍යතාවය මත ඉදිකිරීමක් නොවන අතර, මෙය සමාගමට අවශ්‍ය පරිදි සකසා ගැනීමට රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර කටයුතු ආරම්භ වූ පසු සිදුකිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි. | මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේද සකසා ගතයුතුය. |
| (ආ) | 1986 වර්ෂයේ ඉදිකර තිබූ ගිරාදුරුකෝට්ටේ සත්ත්ව ගොවිපලට අයත් ගොඩනැඟිලි 57 ක් 2019 වර්ෂයේදී නැවත තක්සේරු කර ගිණුම්වලට ගෙන තිබුණ ද මින් ගොඩනැඟිලි 7 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පවතින හෙයින් ප්‍රයෝජනයට ගත හැකි තත්වයක නොපැවතුණි. | ඉදිරි වර්ෂයේදී මෙම ගොඩනැගිලි 07 පිළිබඳව සුදුසු කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |